# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1553 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 07/10/2024
පැය 1725

**මාධ්‍ය නිවේදනය**

**විවිධ පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

පොලිස් ස්ථාන වෙත වාර්තා වන විවිධ පැමිණිලි නොපමාව විභාග කිරීමට හා මෙතෙක් විභාග අවසන් නොවූ පැමිණිලි සති දෙකක් ඇතුලත විභාග කර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතු බවට, වැඩබලන පොලිස්පතිතුමා විසින් සියලුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් සහ දිස්ත්‍රික් භාර නිළධාරීන්, මූලස්ථාන පොලිස් පරික්ෂකවරුන් හා ස්ථානාධිපතිවරුන් වෙත විශේෂ පණිවිඩයක් යොමු කරමින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව පොලිස් ස්ථාන වෙත සුළු සිද්ධියක් වශයෙන් වාර්තා වන පැමිණිල්ලක් වඩා බරපතල අපරාධයක් බවට පත්වීම හා පොලිසිය කෙරෙහි මහජනතාවගේ විශ්වාසය පළුදුවීම වැනි අගතිදායක තත්වයන් වලක්වා ගැනීම සඳහා මින් ඉදිරියට පොලිස් ස්ථාන වෙත වාර්තා වන පැමිණිලි වාර්තා වූ දිනයේම විභාග කිරීම ආරම්භ කිරීමටත්, පැය 48ක් ඇතුලත විභාග අවසන් කිරීමටත් වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**